


PHOTO - AUSNEWS LANKA

# නාට්‍ය, වේදිකාව, රංගය සහ මෙල්බර්න් ප්‍රජාව - 5



ආචාර්ය
තරංග
දන්දෙනිය

දරුවන්ගේ හපන්කම් තරම් අගය කළ යුතු දෙයක් බොහෝ දෙමාපියන් හට නොමැත. අයෙක් තම දරුවෝ කලාවට වඩා වෙනත් කුසලතාවයන් ප්‍රගුණ කරනවාට කැමැත්තේ නමුදු ඇතැමෙක් තම දරුවෝ කලාවට යොමුවන අයුරු දැක සතුටු වෙති, එයට අනුබල දෙති. එපමණක් නොව, ඔවුහු තම හිතවතුන්හට ද එම කුසලතාවයන් ප්‍රදර්ශනයට උත්සුක වෙති.

දරුවන් අරමුණු කරගත් කලා කටයුතු පිළිබඳව විග්‍රහ කරනවානම් එහි ප්‍රධාන ධාරාවන් කිහිපයක් දක්නට ඇත. එනම්, 1) වැඩිහිටියන් විසින් දරුවන් උදෙසා සිදු කරන කලා ක්‍රියාවන්, 2) වැඩිහිටියන් දරුවන් යොදාගෙන සිදුකරන කලා ක්‍රියාවන්, 3) වැඩිහිටියන් සහ දරුවන් මිශ්‍රව සිදු කරන කලා ක්‍රියාවන්, සහ 4) දරුවන් විසින් ම කරන කලා ක්‍රියාවන්.

දරුවන් අරමුණු කරගත් ඇතැම් රංග ක්‍රියාකාරකම් අධ්‍යාපන ක්‍රියාකාරකම් ලෙස ද සැලකිය හැකිය. එසේ වන්නේ, එම රංග ක්‍රියාකාරකම් සඳහා යොදාගන්නා භාෂාව, සහ චාරිත්‍ර විධීන් සහ පාරම්පරික නාද රටා ඇතුලු සංස්කෘතික මූලාශ්‍ර, ඍජු ව සහ වක්‍ර ව දරුවන් හට සංස්කෘතික දැණුම සංජානනය කරන බැවින්ය.

ඕස්ට්‍රේලියාව වැනි ශ්‍රී ලාංකීය සංක්‍රමණිකයෝ ජීවත් වන සමාජ පරිසරයක දී ඔවුන් අතරින් පැන නැගෙන්නා වූ දරුවෝ අරමුණු කරගත් කලා ක්‍රියාකාරකම් ඇතිවන්නේ තරමක් මන්දගාමීවය. මීට පෙර ලිපි මගින්ද පැහැදිලි කළ පරිදි, වෙනස් වූ ආගමන නීතීන් සමඟ ශ්‍රී ලාංකීය සංක්‍රමණිකයෝ වැඩි වශයෙන් පැමිනෙන්නේ 80 දශකයේ මැද භාගයේදී පමණය. එකල තනිකඩ ව හෝ අළුත විවාපත් ව සිටි ඔවුහු බොහෝමයක් දරු පරපුරක් ගොඩනංවන්නේ මෙරට තරමක් තම ජීවිත ස්ථිර වූවාට පසුවය. එබැවින්, එම සංක්‍රමණික පරම්පරාවේ දරුවෝ පාසල් අරඹන්නේ හෝ ගැටවර වියට එළඹෙන්නේ පසුගිය දශකයේදීය. එමෙන්ම, 2000 මුල් දශකයේ වැඩි වශයෙන් ඇදී ආ ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ලෙස පැමිණි අනෙක් පරම්පරාව විවාහ ප්‍රාප්තව තම දරු පරම්පරාවක් ගොඩනංවන්නේ දෙදහස් දහය දශකයේදීය.

1980 දශකයටත් පෙර සිටි පරම්පරාවේ ඇත්තෝ තම දරුවන් හට කලාවක් දායාද කලානම් ඒ වැඩි වශයෙන් ම වූයේ තමා දන්නා ශ්‍රී ලාංකීය ගායනයක් හෝ නර්තනයක් දරුවන් හට කියා දීම සහ පවුලේ උත්සව උදෙසා දරුවන්ගේ කුසලාතා පෙන්වීමට අවස්ථාව සලසා රසවිඳීමය. ඇතැම්විට කලා කටයුතු සඳහා උනන්දුව දැක්වූ පවුල් හෝ යම් සමාජ බලයක් හිමි කරගෙන සිටි පවුල්වල ඇත්තෝ සංස්කෘතික හා දේශපාලන උත්සවවල දී  තම දරුවන්ද ඇතුලත් කලාංග ඉදිරිපත් කරන ලදී. 1980 දශකයේ වූ රංගකලා කටයුතු ගැන සඳහන් කළ හිතවත් රත්නා ගුරුසිංහ පැවසුවේ, දම්මි පලංසූරිය දරුවන් හට නැටුම් පන්තියක් එම දශකයේ මුල දී ආරම්භ කළ වගය. එමෙන්ම එම වකවානුවේ රත්නා ගුරුසිංහ මූලිකව ඉදිරිපත් කළ ඉබ්බා අහසින් ගිය හැටි සහ සමගි මහිම වැනි ළමෝ උදෙසා කළ නාට්‍යය දෙකක් ගැනද ඇය සඳහන් කළාය.

1990 දශකයේ මැද භාගයේ දී මාලනී ජයසිංහ මහත්මිය ආදිහු මූලික වී සංවිධනය කරනු ලැබූ නාට්‍ය රංග කලා වැඩසටහන් සහ වේදිකා රංගනයන් සඳහා ප්‍රජාවේ යම් කොටසක් නිර්මාණකරණයේ දී මෙන්ම ප්‍රේක්ෂකයන් ලෙස ද සහභාගී විය. පසුකාලීන රංගකලා කටයුතු සඳහා සහභාගී වන දරු දැරියෝ අතර ඉහත කී පරම්පරාවේ දරු දැරියන් දැකිය හැකිය.

ක්‍රමයෙන් මෙල්බර්න් ආශ්‍රිත උප නගරවල බිහි වූ ශ්‍රී ලාංකීය බෞද්ධ ආගමික ස්ථාන ද ආචාර්ය කරු ලියනාරච්චි ආදීහු මුල්වී ඇති කළ සිංහල භාෂා පාසල් ද සංක්‍රමණිකයන්ගේ දරුවන් හට කලා කටයුතු සඳහා යෙදීමට මනා වාතාවරණයක් සපයන ලදී. මෑත කාලීනව, භාෂා පාසල්වලදී හෝ දහම් පාසල් ආශ්‍රිතව සිදු කෙරෙනා විවිධ ප්‍රසංගවලදී මේ තත්ත්වය ඉතා හොඳින් දැකිය හැකිය. උදාහරණයක් ලෙස, එක් තේමාවක් යටතේ ද්වි වාර්ෂිකව සිදුකරනා වික්ටෝරියානු භාෂා පාසල් හි ප්‍රසංග, විනෝදාස්වාදය පමණක් නොව අධ්‍යාපන ද අරමුණු කරගත් රංග ක්‍රියාකාරකම් සැලකිය හැකිය.

1990 දශකයේ අගභාගයේ දී, ජර්මානු කාර්මික අභ්‍යාස විද්‍යාලයේ ආදි විද්‍යාර්ථීහු එක්ව අරඹන ලද ගිම්හාන රංගන කලා උළෙල එහි සාමාජිකයන් සහ ඔවුන්ගේ දරුවන් හට ගීත නැටුම් ආදීන් ඉදිරිපත් කිරීමට වේදිකාවක් තනන ලදී. දරුවන් උදෙසා වේදිකා නාට්‍ය ද මෙහිදී ඉදිරිපත් වූ අතර, ප්‍රජා නාට්‍ය කලාවේ නියුතු ගාමිණී රණසිංහ සහ නන්දසිරි සිල්වා ආදීන්ගේ දායකත්වය සඳහන් කළ යුතුය. පසු කලෙක ‘යෞවන රංගන’ ලෙස දරුවන් උදෙසා

11 වන පිටට

